මහ බැංකු 2015 වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වූ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සමස්ත නිරීක්ෂණය

සමිල පෙරේරා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 66 වැනි වාර්ෂික වාර්තාව (2015 වාර්ෂික වාර්තාව) මගින් පිළිබිඹු වන ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සමස්ත නිරීක්ෂණය මූලිකව සැලකිල්ලට ගැනීමේදී 2015 වසරේදී, ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය, 2014 වසරේදී වාර්තා වූ 4.9% ක වර්ධනය සමග සැසඳීමේදී, මේ වසරේදී 4.8% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2015 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සඳහා පාරිභෝජන ඉල්ලුම වර්ධනය ප්‍රධාන වීම

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනම 2015 වසරේදී ආර්ථිකයේ මූර්ත වර්ධනය සඳහා දායක වූ බව මහ බැංකු වාර්ෂික වාර්තාව පෙන්වා දෙයි. එහිදී, ද.දේ.නි.යේ 56.6% කට දායක වන සේවා අංශය 5.3% කින් වර්ධනය වී ඇති අතර, ඒ සඳහා මූල්‍ය සේවා (15.8%), නිශ්චල දේපළ ක්‍රියාකාරකම් (9.6%), ප්‍රවාහන කටයුතු (5.5%) සහ තොග සහ සිල්ලර වෙළෙඳාම (4.7%) යන උප අංශවල වර්ධනය උපකාරී වී තිබේ. ඉදිකිරීම් (-0.9%) සහ පතල් හා කැණීම් (-0.9%) කටයුතු සුළු වශයෙන් මන්දගාමී වුවද, ද.දේ.නි.යේ 26.2% කට දායක වන කර්මාන්ත කටයුතු ප්‍රධාන වශයෙන් නිෂ්පාදන කටයුතුවල සිදු වූ වර්ධනය (4.7%) හේතුවෙන් 3.0% කින් වර්ධනය වී ඇත. ධීවර (-2.7%), රබර් වගාව (-10.1%) සහ තේ වගාව (-2.6%) පහළ යෑම මධ්‍යයේ වුවද, වී (23.3%) සහ එළවළු (24.9%) වගාවේ සිදු වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් ද.දේ.නි.යේ 7.9% ක් වන කෘෂිකාර්මික කටයුතු 5.5% කින් වර්ධනය වී තිබේ. වියදම් ප්‍රවේශය අනුව 2015 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ප්‍රධාන වශයෙන් පාරිභෝජන ඉල්ලුම වර්ධනය මගින් සිදුවූ අතර, ආයෝජන ක්‍රියාකාරකම් සුළු දායකත්වයක් දක්වා ඇත.

දේශීය ඉතිරිකිරීම් හා ජාතික ඉතිරිකිරීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස පෙර වසරට සාපේක්ෂව පහළට

එමෙන්ම, දේශීය ඉතිරිකිරීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ වාර්තා වූ 24.0% ක සිට 2015 වසරේදී 22.6% ක් දක්වා අඩු වී තිබේ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණයන්හි රුපියලේ අගය සුළු වශයෙන් ඉහළ යෑම හමුවේ වුවද, 2015 වසරේ දී ආයෝජන මත වූ ඉපැයුම් අඩුවීම සහ ගෙවීම් වර්ධනය වීම හේතුවෙන් ලෝකයේ සෙසු රටවල් සමග වූ ශුද්ධ ප්‍රාථමික ආදායම පහළ යෑම හේතුවෙන් ජාතික ඉතිරිකිරීම් පහත වැටුණු බවද පෙන්වා දෙයි. ඒ අනුව ජාතික ඉතිරිකිරීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවැති 29.5% සිට 2015 වසරේදී 27.8% ක් දක්වා පහත වැටී තිබේ. මේ අතර ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ආයෝජන අඩු වීම, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතිරිකිරීම් අඩුවීමට වඩා ඉහළ අගයක් ගැනීම හේතුවෙන් 2015 වසර තුළ දී ඉතුරුම් ආයෝජන පරතරය අඩු වී ඇත.

පුරුෂ සේවා වියුක්ති අනුපාතය පහළට, ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතය ඉහළට

විශේෂයෙන්ම කාන්තාවන්ගේ ශ්‍රම බළකා සහභාගිත්වයේ සුළු වර්ධනය මධ්‍යයේ සේවා වියුක්ති අනුපාතය, 2014 වසරේ වාර්තා කළ 4.3% හා සැසඳීමේදී 2015 වසරේදී 4.6% දක්වා ඉහළ ගොස් තිබේ. 2014 වසර හා සැසඳීමේදී, 2015 වසරේ දී පුරුෂ සේවා වියුක්ති අනුපාතය 3.1% සිට 3.0% දක්වා අඩු වී ඇති අතර, කාන්තා සේවා වියුක්ති අනුපාතය 6.5% සිට 7.6% දක්වා ඉහළ ගොස් තිබේ. තරුණයන් හා අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත වූවන් අතර සේවා වියුක්තිය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ශ්‍රම බළකාය තුළ ග්‍රාමීය අංශයේ කාන්තා සහභාගීත්වය ඉහළ යෑමත් සමග 2015 වසරේදී ශ්‍රම බළකා සහභාගිත්ව අනුපාතය, 2014 වසර තුළදී වූ 53.3% සිට 53.8% දක්වා ඉහළ ගොස් ඇත. එසේම ආර්ථිකයේ අංශ තුනෙහිම ධනාත්මක දායකත්වය සමග 2015 වසර තුළදී ශ්‍රම ඵලදායීතාව ඉහළ ගොස් තිබේ. මේ අතර, මැද පෙරදිග භූ-දේශපාලන අවිනිශ්චිතතාව ඉහළ යෑම සහ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි පසුබෑම හේතුවෙන් රැකියා සඳහා විදේශ ගතවන සංඛ්‍යාව 12.4% කින් වූ තියුණු පසුබෑමකට ලක්ව ඇති බවත් මෙයද, සේවා වියුක්ති අනුපාතයට හා ශ්‍රම බළකා සහභාගිත්වට බලපාන ලද බවත් මෙම වාර්තාව පෙන්වා දෙයි.

උද්ධමනය මැද තනි අගයක මට්ටමට පහළින් පැවතීම

මේ අතර, ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ කිහිපයක මිල පහත හෙළීම, දේශීය හා විදේශීය වෙළෙඳ පොළවල සැපයුම් අංශයේ පැවැති හිතකර වර්ධනයන් මෙන්ම මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා හේතුවෙන්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07=100) මත පදනම් වූ උද්ධමනය, මැද තනි අගයක මට්ටමට පහළින් පැවතුණු බවද පෙන්වා දෙයි. 2015 අතුරු අයවැයෙන් හඳුන්වා දුන් මිල සංශෝධන සමග, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය, 2015 ජනවාරි මාසයේ දී වාර්තා වූ 3.2% හා සාපේක්ෂව 2015 පෙබරවාරි මාසයේදී 0.6% දක්වා ශීඝ්‍ර ලෙස අඩු වී තිබේ. ඉන්පසු, 2015 සැප්තැම්බර් මස වන තුරු, 1% කට අඩු මට්ටමේ පැවැති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය, 2015 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලයේදී සෘණ අගයක් වාර්තා කර ඇත. 2015 වසරේ සිවු වැනි කාර්තුව තුළ ඉහළ යමින් පැවැති උද්ධමනය 2015 වසර අවසානය වනවිට 2.8% ක අගයක් වාර්තා කර තිබේ. වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය, 2014 වසර අවසානයේ වාර්තා කළ 3.3% ට සාපේක්ෂව 2015 වසර අවසානය වනවිට 0.9% දක්වා අඩු වී ඇත. වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය, 2014 වසර අවසානයේ වාර්තා කළ 3.5% හා සාපේක්ෂව 2015 වසර අවසානය වනවිට 3.1% දක්වා අඩු වුවද, ආර්ථිකයේ ක්‍රමයෙන් වර්ධනය වන ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පදනම් වූ මූලික උද්ධමනය, 2014 වසර අවසානයේ වාර්තා කළ 3.2% සිට 2015 වසර අවසානය වනවිට 4.5% දක්වා ඉහළ ගිය බවද පෙන්වා දෙයි. මේ අතර, 2015 වසරේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද. 2013 = 100) හඳුන්වා දෙනු ලැබූ අතර, එමගින් ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/2013 මත පදනම්ව සියලු පළාත්වල මිල උච්චාවචන සහ පාරිභෝජන රටාවල වෙනස්කම් ආවරණය කරනු ලබයි. 2015 වසර අවසානයේ, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය 4.2% ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 3.8% ක් විය. විශේෂයෙන්ම, වැටුප් අනුපාත දර්ශකයෙහි වෙනස මගින් පිළිබිඹු වන පරිදි රාජ්‍ය අංශ වැටුප් උද්ධමනය ඉහළ මට්ටමක පැවැති බවත්, 2015 වසර තුළදී රාජ්‍ය අංශයේ වැටුප් අනුපාතික දර්ශකය නාමික වශයෙන් 31.7% ක්ද, මූර්ත වශයෙන් 27.0% ක්ද වූ බවත් පෙන්වා දෙයි.

ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය සුළු වශයෙන් අඩු වුවද, නිරපේක්ෂ වශයෙන් වර්ධනය වීම

ගෝලීය ආර්ථික වාතාවරණය වෙනස්වීමේ බලපෑම මෙන්ම දේශීය ආර්ථිකයේ වර්ධනයන් රැසක් ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය මගින් පිළිබිඹු වී ඇත. ඛනිජතෙල් ආනයන වියදම අඩුවීමේ ප්‍රතිලාභ තිබියදීත්, ඉන්ධන නොවන ආනයන වර්ධනය වීම සහ අපනයන ආදායම් අඩුවීම පිළිබිඹු කරමින් වෙළෙඳ හිඟය පෙර වසරට සාපේක්ෂව 1.7% කින් සුළු වශයෙන් පුළුල් වී ඇත. සංචාරක පැමිණීම් අඛණ්ඩව වර්ධනය වීම සහ සංචාරකයන්ගේ වියදම් වර්ධනය වීම හේතුවෙන් සංචාරක ඉපැයීම් වර්ධනය වූ බවත්, වසර තුළදී සේවා ගිණුමෙහි ක්‍රියාකාරිත්වය වර්ධනය වීමට මෙය විශාල ලෙස දායක වූ බවත් පෙන්වා දෙයි. 2015 වසරේදී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් වී ඇත. කෙසේ වුවද, ද්විතියික ආදායම් සහ සේවා ගිණුම්වල අතිරික්තයන්, විදේශීය ජංගම ගිණුමේ ඉහළ හිඟය අවම කිරීමට උපකාරී වී ඇත. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2014 වසරේ පැවැති 2.5% හි සිට 2015 වසරේදී 2.4% ක් දක්වා සුළු වශයෙන් අඩු වුවද, නිරපේක්ෂ වශයෙන් එය සුළු වශයෙන් වර්ධනය වී ඇත.

දළ නිල සංචිත 2015 අවසානයේදී ඇ.ඩො.බිලියන 7.3 ක් දක්වා අඩු වෙමින්, ඩොලරයට සාපේක්ෂව රුපියල 9.03කින් අවප්‍රමාණය වීම

ජංගම ගිණුමෙහි පැවැති මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වය සමග රජය, බැංකු හා පෞද්ගලික අංශ වෙත ලැබුණු ණය හා සෘජු විදේශීය ආයෝජන අඩුවීම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳ පොළෙන් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම් ආකාරයට මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු වීම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි එ.ජ. ඩොලර් මිලියන 1,489 ක හිඟයක් වාර්තා වී ඇත. ගෙවුම් තුලනයේ පිරිහීමත් සමග රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය 2014 වසරේ තිබූ එ.ජ. ඩොලර් බිලියන 8.2 හි සිට 2015 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් දක්වා අඩු වී ඇත. මේ අතර, වසරේ පළමු වැනි මාස 8 තුළදී බොහෝ සෙයින් ස්ථායීව පැවැති රුපියලෙහි අගය, විනිමය අනුපාතය නිර්ණය කිරීමේදී වෙළෙඳ පොළ බලවේග අනුව ඉහළ නම්‍යශීලීතාවක් ඇති කිරීමට මහ බැංකුව ගත් තීරණයත් සමග සැප්තැම්බර් මස මුල සිට ශීඝ්‍රයෙන් අවප්‍රමාණය වෙමින්, 2015 වසර අවසානය වනවිට, එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල 9.03% ක අවප්‍රමාණයක් වාර්තා කර තිබේ.

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 7.4% දක්වා ඉහළට

2015 වසර සඳහා වන අතුරු අයවැය මගින් වසර තුළදී අයවැය හිඟයෙහි ශීඝ්‍ර අඩුවීමක් අපේක්ෂා කළද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අභියෝගාත්මකව සිදුවූ වර්ධනයන් ගණනාවක් නිසා සැලසුම් කළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ළඟා කරගැනීමට බාධා ඇති වී තිබේ. ජනවාරි මාසයේ පැවැති ජනාධිපතිවරණයෙන් පසුව ඉදිරිපත් කළ අතුරු අයවැය මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියෙහි අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කරගැනීමේ අරමුණින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ගණනාවක් හඳුන්වා දී ඇත. 2015 වසරේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවෙහි සඳහන් මැතකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි (2014-2017) ඉලක්කයන්ට අනුකූලව රජයේ අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ වාර්තා වූ 5.7% සිට 2015 වසරේ දී 4.4% දක්වා අඩු කිරීමට අපේක්ෂා කළ බවත්, 2015 වසර තුළදී මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 72.0% ක මට්ටමක පවත්වා ගැනීමටද අපේක්ෂා කළ බවත් පෙන්වා දෙයි. එසේ වුවද වසර තුළදී රාජ්‍ය මූල්‍ය අංශය ළඟා කරගත් සංවර්ධනයන් 2015 වසර සඳහා අතුරු අයවැයෙහි සඳහන් අයවැය ඉලක්කයන්ගෙන් සැලකිය යුතු ලෙස වෙනස් වෙමින් 2015 වසරේ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය පිරිහීමට ලක් වී තිබේ. රජයේ ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවීම විශේෂයෙන් වැටුප් සහ වේතන සඳහා වූ ඉහළ පුනරාවර්තන වියදම්, සුභසාධන වියදම් සහ පොලී ගෙවීම් ඇස්තමේන්තුගත අගයට වඩා ඉහළ යෑම යනාදිය 2015 වසරේ සමස්ත අයවැය හිඟය මත සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය, මුල් අයවැයෙහි ඉලක්කය වූ 4.4% සැලකිය යුතු ලෙස අභිබවා යමින් 2014 වසරේ පැවැති 5.7% සිට 2015 වසරේදී 7.4% දක්වා ඉහළ ගොස් ඇත.

රජයේ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 76.0% ක් දක්වා ඉහළට

මේ අතර, රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කරන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ පැවැති 1.2% සිට 2015 වසරේදී 2.2% දක්වා ඉහළ ගිය අතර, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීමේ වියදම් ඉවත් කර සකසන ප්‍රාථමික ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේදී පැවැති 1.5% සිට 2.9% දක්වා වැඩි විය. වසර තුළදී ලද විදේශීය මූල්‍යයනය සාපේක්ෂව අඩුවීමත් සමග අයවැය හිඟය මූල්‍යයනය කිරීම ප්‍රධාන වශයෙන්ම දේශීය මූලාශ්‍රවලින් සිදු වී තිබේ. සාපේක්ෂව ඉහළ අගයක් ගත් අයවැය හිඟය, නාමික ද.දේ.නි.යේ අඩු වර්ධනය සහ විනිමය අනුපාතික වෙනස්වීම්හි බලපෑම පිළිබිඹු කරමින් මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2014 වසරේදී පැවැති 70.7% සිට 2015 වසර අවසානයේදී 76.0% දක්වා ඉහළ ගියේය. ණය එක්රැස්වීම අඩු කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව එමගින් අවධාරණය කරන බවද පෙන්වා දෙයි.

උද්ධමනය මත ඇතිවිය හැකි අධික ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීමට මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම

අඛණ්ඩව පැවැති අඩු උද්ධමනකාරී පරිසරයක් තුළ, මහ බැංකුව විසින් වසර පුරා මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල්ව පවත්වා ගනු ලැබූ අතර, ඉහළ ණය හා මුදල් ප්‍රසාරණය හේතුවෙන් උද්ධමනය මත ඇතිවිය හැකි අධික ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීමේ අරමුණින් 2015 අග භාගයේ සිට මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම ආරම්භ කර තිබේ. පසුගිය වසර කිහිපය මුළුල්ලේම පැවැති අඩු පොලී අනුපාතික පරිසරයෙහි බලපෑම හේතුවෙන් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය නොකඩවා ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, 2014 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වූ විට වෙළෙඳ පොළ කටයුතු යටතේ නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ප්‍රවේශ වීමේදී පනවනු ලැබූ සීමා 2015 මාර්තු මාසයේදී මහ බැංකුව විසින් ඉවත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් කෙටිකාලීන පොලී අනුපාතිකවල ඇතිවිය හැකි ඉහළ උච්චාවචන මැඩපැවැත්වීම සඳහා, මහ බැංකුව 2015 අප්‍රේල් මාසයේදී, සිය ප්‍රධාන පොලී අනුපාතික වන, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින්, 6.00% සහ 7.50% දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලදී. පුරෝකථන ඉක්මවා යමින් ණය හා මුදල් සමස්ත තවදුරටත් ප්‍රසාරණය වීමත් සමග, 2015 වසර අවසානයේ සිට මහ බැංකුව ක්‍රමයෙන් සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට කටයුතු කර තිබේ. ඒ අනුව, එතෙක් ක්‍රියාත්මක වූ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි අවසානය සනිටුහන් කරමින්, 2016 ජනවාරි මස 16 වැනි දින ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 7.50% දක්වා ප්‍රතිශතාංක 1.50 කින් ඉහළ නංවන ලදී. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ඇරඹීමටත් පෙර, ආර්ථිකයේ ඇතැම් තෝරාගත් අංශ වෙත අධික ලෙස ණය සැපයීම පාලනය කිරීම සඳහා 2015 අවසාන කාර්තුව තුළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රථවාහන මිලදී ගැනීම සහ භාවිත කිරීමට ලබාදෙන ණය සහ අත්තිකාරම්වලට අදාළව, රථවාහන ආනයනය සඳහා වාණිජ බැංකු සමග ණයවර ලිපි විවෘත කිරීමේදී බලපවත්වන ලද අවම ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාව පසුව සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් ණය සහ අත්තිකාරම්වලට අදාළව වටිනාකම මත උපරිම ණය අනුපාතිකයක් මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙම ක්‍රියාමාර්ග තුළින් විනිමය අනුපාතික තීරණය කිරීමේදී වඩාත් නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ රජය විසින් බදු ව්‍යුහයෙහි සිදුකළ වෙනස්කම් යනාදී ක්‍රියාමාර්ග සමග සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කරන අතරම, පෞද්ගලික ණය හා අත්තිකාරම්වල ඉහළ වර්ධනය පාලනය කෙරෙනු ඇතැයි අපේක්ෂා කර තිබුණි. එසේ වුවත්, අඛණ්ඩව පැවැති අධික මුදල් ප්‍රසාරණය හේතුවෙන්, ඉල්ලුමෙන් ඇදුණු උද්ධමන පීඩන තවත් ඉහළ යෑමේ හැකියාව සලකා බලමින්, පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස, 2016 පෙබරවාරි 19 වැනිදා අවසානයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 50 බැගින්, පිළිවෙළින්, 6.50% සහ 8.00% දක්වා ඉහළ නංවන ලද බවද පෙන්වා දෙයි.

දේශීය ණය ප්‍රසාරණය හේතුවෙන් ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම පුළුල් මුදල් ප්‍රසාරණය සඳහා හේතු වීම

පෞද්ගලික සහ රාජ්‍ය අංශයට ලබාදුන් ණය ප්‍රසාරණය හේතුවෙන් පුළුල් මුදල් සැපයුමේ (M2b) වර්ධනය 2015 වසර තුළ දී ඉහළ ගොස් ඇත. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2014 වසර අවසානයේ පැවැති 13.4% හා සැසඳීමේදී 2015 වසර අවසානය වනවිට 17.8% ක් දක්වා ඉහළ ගිය අතර, වසර තුළදී පුළුල් මුදල් සැපයුමේ සාමාන්‍ය වර්ධනය 15.2% ක් විය. වසර තුළදී බැංකු පද්ධතිය තුළ ශුද්ධ විදේශ වත්කම් අඩු වූ අතර, දේශීය ණය ප්‍රසාරණය හේතුවෙන් ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම, පුළුල් මුදල් ප්‍රසාරණය සඳහා මුළුමනින්ම හේතු වී තිබේ. පෞද්ගලික සහ රාජ්‍ය යන අංශ දෙක වෙත ලබාදුන් ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන්, ශුද්ධ දේශීය වත්කම් 2015 වසර තුළදී 26.0% කින් වර්ධනය වී ඇත. ශුද්ධ දේශීය වත්කම් තුළ, රජයට ලබා දුන් ශුද්ධ ණය, රජයේ අයවැය මගින් ඇස්තමේන්තු ගත සීමාව ඉක්මවා රු.බිලියන 323.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මේ අතර, රාජ්‍ය සංස්ථා විසින් ලබාගත් ණය ප්‍රසාරණය 2014 වසරේදී වාර්තා වූ රු.බිලියන 80.9 ක ඉහළ යෑම හා සාපේක්ෂව 2015 වසරේදී දී රු.බිලියන 76.1 දක්වා සුළු වශයෙන් අඩු වී තිබේ.

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ වේගයකින් වර්ධනය වීම

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පැවතීමෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ වේගයකින් වර්ධනය වී ඇත. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම අනුව, පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණය 2014 වසර අවසානයේ වාර්තා කළ 8.8% ක වර්ධනය හා සාපේක්ෂව, 2015 වසර අවසානයේදී 25.1% ක් දක්වා ඉහළ ගොස් ඇත. නිරපේක්ෂ වශයෙන් සැලකීමේදී, පෞද්ගලික අංශයට ලබාදුන් ණය ප්‍රමාණය 2014 වසරේදී වාර්තා වූ රු. බිලියන 223.9 හා සැසඳීමේදී 2015 වසරේදී රු. බිලියන 691.4 කින් වැඩි වී තිබේ. අඛණ්ඩව අඩු මට්ටමක පැවැති වෙළෙඳ පොළ ණය පොලී අනුපාතික සහ ණය දෙන ආයතන විසින් සිදුකරන ලද තරගකාරී ප්‍රචාරණයෙහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. වෙළෙඳ පොළ පොලී අනුපාතික වසරේදී අවසාන කාලය තුළදී යම් ඉහළ යෑමක් දක්නට ලැබුණද 2015 වසර තුළ අඩු මට්ටමක පැවතුණි.

බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය වසර තුළදී වර්ධනය වීම

දේශීය මෙන්ම ගෝලීය අවිනිශ්චිතතාවන් නිසා පැන නගින වෙළෙඳ පොළ උච්චාවචනවලට ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කරමින් දේශීය මූල්‍ය අංශය 2015 වසරේදී යහපත් කාර්යසාධනයක් පෙන්වූ බව කියයි. මූල්‍ය ආයතන පිළිබඳව සලකා බැලූ විට බැංකු අංශය, අඩු පොලී අනුපාතික වාතාවරණය තුළ ණය ඉල්ලුම ඉහළ යෑම, ඉහළ ලාභදායීත්වය හා අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය හේතුවෙන් ව්‍යාපාරික කටයුතුවල ප්‍රසාරණයක් පෙන්නුම් කරන ලද බවත්, අහිතකර කම්පන නිසා ඇතිවිය හැකි අවදානම් අවශෝෂණය කරගැනීමේ හැකියාව වර්ධනය කරගැනීමට පාදක වී ඇති බවත් පෙන්වා දෙයි. බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය වසර තුළදී වර්ධනය වී තිබේ. එමෙන්ම, මූල්‍ය හා කල්බදු සමාගම් අංශයද ඉහළ කාර්යසාධනයක් වාර්තා කර ඇති අතර, දේශීය මූල්‍ය පද්ධතියේ සමස්ත වත්කම්වලට දරන සාපේක්ෂ දායකත්වය ඉහළ යෑමෙන් මෙම තත්ත්වය පිළිබිඹු වී තිබේ. ද්‍රවශීලතා ගැටලු සහිත මූල්‍ය ආයතන කිහිපයක තැන්පත්කරුවන් හා ආයෝජකයන් රැකගැනීම සඳහා 2015 වසරේදීද ශ්‍රී ලංකා මහබැංකුව විසින් නියාමන මැදිහත්වීම් සිදුකර තිබේ.

ගෝලීය අවිනිශ්චිතතා සමග දේශීය මූල්‍ය වෙළෙඳ පොළ ඉහළ උච්චාවචනයකින් යුතුව මෙහෙයුම් කටයුතු සිදුකරයි

රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳ පොළෙහි ප්‍රාථමික වෙළෙඳුන්ගේ ව්‍යාපාර ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වුවද, මෙහෙයුම් කටයුතුවල ඉතා සුළු කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, එක් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ද්‍රවශීලතා ගැටලුවලට මුහුණදීම හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීමට හා රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳ පොළෙහි මෙහෙයුම් කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා නියාමන මැදිහත්වීම්වල අවශ්‍යතාව පැනනැගී තිබුණි. වෙළෙඳ පොළ පැවැති අඩු පොලී අනුපාතික හමුවේ වුවද ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන පසුගිය වසරේදී ලැබූ ප්‍රතිලාභවලට ආසන්න ව්‍යාපාර ප්‍රතිලාභයක් ලබාගැනීමට සමත් වී ඇත. අනෙකුත් බැංකු නොවන මූල්‍ය ආයතනද, ව්‍යාපාර වර්ධනයන් වාර්තා කළද ඒවායේ ව්‍යාපාර ආකෘති මෙන්ම පැවැති මූල්‍ය වෙළෙඳ පොළ තත්ත්ව හමුවේ මිශ්‍ර මෙහෙයුම් කාර්යසාධනයක් පෙන්වා තිබේ. වසර තුළ, ගෝලීය අවිනිශ්චිතතාව නිසා පැනනැගුණු මුදල් හා ගෙවුම් තුලන තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස දේශීය මූල්‍ය වෙළෙඳ පොළ ඉහළ උච්චාවචනයකින් යුතුව මෙහෙයුම් කටයුතු සිදුකරන ලදී. මේ අතර, විශාල හා සුළු පරිමාණ වටිනාකම් සහිත දේශීය ගෙවීම් හා පියවීම් පද්ධතිය කිසිදු බාධාවකින් හා ස්ථායිතා ගැටලුවලින් තොරව සුමටව ක්‍රියාත්මක වූ බවත්, මූල්‍ය අංශයේ වර්ධනය වෙමින් පවතින විවිධ ගෙවීම් අවශ්‍යතා සඳහා ඉහළ කාර්යක්ෂමතාවකින් හා සුරක්ෂිතතාවකින් පහසුකම් සලසන ලද බවත් පෙන්වා දෙයි.

ආදායම් සහ වියදම් මෙන්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ඇතුළුව සුදුසු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්මිශ්‍රණයක් හඳුන්වාදීමේ අවශ්‍යතාවක්

කාලයක් මුළුල්ලේ වර්ධනය වෙමින් පැවැති ආර්ථිකයේ ව්‍යුහාත්මක ගැටලු 2015 වසර තුළදීද පැහැදිලිව දැක ගත හැකිවූ බවත්, ඉහළ ආර්ථික වර්ධනයක් හා අඩු උද්ධමනයක් සහිත මාවතකට ගමන් කිරීම සහතික කිරීම සඳහා මෙම ගැටලු නිවැරදි කරගැනීමට, ස්ථාවර ක්‍රියාමාර්ග අවශ්‍යව ඇති බවත් පෙන්වා දෙයි. ආර්ථික වර්ධනයට අඛණ්ඩව සහාය වීම සඳහා කෙටිකාලීන රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ප්‍රමාණවත් නොවන අතර, සම්පත් සංරෝධක සහ දැඩි ප්‍රතිපත්ති පැවැතීම තුළින්, එවැනි කෙටිකාලීන ප්‍රතිපත්ති තවදුරටත් යොදාගත නොහැකි බව පැහැදිලි වී ඇති බවද පෙන්වා දෙයි. ඒ නිසා, ණය නොවන ප්‍රාග්ධන අරමුදල් ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති අඛණ්ඩව පැවතීම සහතික කිරීමට මෙන්ම ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ආදායම් සහ වියදම් මෙන්ම රාජ්‍ය ව්‍යවසායන්ට අදාළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ඇතුළුව සුදුසු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්මිශ්‍රණයක් හඳුන්වා දීම අවශ්‍ය වන බවද පෙන්වා දෙයි. පෞද්ගලික අංශයේ පුළුල් සහභාගීත්වය ඇතිව රටෙහි මානව සම්පත ඇතුළු ශක්තීන් උකහා ගැනීම සහ එක්තැන් කිරීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ ඉලක්ක කරගත යුතු බවද පෙන්වා දෙයි.

මැදි කාලීනව තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීම සඳහා ඇති ගැටලුවලට ගත යුතුව ඇති ක්‍රියාමාර්ග

යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමග ශ්‍රී ලංකා ආර්ථිකය මැදි කාලයේදී නැවතත් ඉහළ වර්ධන මාවතකට ප්‍රවේශ වනු ඇතැයි අපේක්ෂා කර ඇත. මැදි කාලීනව තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීම සඳහා ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වනු, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම පහළ මට්ටමක පැවතීම හා අධික රාජ්‍ය වියදම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන අඩුවීම සහ විදේශ සෘජු ආයෝජන ගලා ඒම ප්‍රමාණවත් නොවීම යනාදිය ඇතුළුව දැනටමත් හඳුනා ගෙන ඇති ගැටලු විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුව ඇති බව මෙහි පෙන්වාදී තිබේ. මීට අමතරව, රජයේ අවධානය යොමු විය යුතු අනෙකුත් ව්‍යුහාත්මක සහ පැනනැගෙමින් පවතින ගැටලු ගණනාවක් ඇති බවත්, ඒ අතර, ඉහළ ගුණාත්මක බවින් යුතු මානව ප්‍රාග්ධනය සඳහා වර්ධනය වන ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කරනු ලබන දක්ෂතා සංවර්ධනය කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, රථවාහන තදබදය හේතුවෙන් ආර්ථිකයට සිදුවන හානිය අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සහ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම, බලශක්තිය හා මහජන උපයෝගීතා සේවා සඳහා වෙළෙඳ පොළ පාදක කරගත් ක්‍රමවත් මිල සූත්‍ර හඳුන්වා දීම, අඩු ඵලදායීතාව, විවිධාංගීකරණය අඩු වීම, ආහාර අනාරක්ෂිතතාව සහ අකාර්යක්ෂම ජල කළමනාකරණය ආදී කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි ගැටලු සඳහා පිළියම් ලබාදීම, රාජ්‍ය සම්පත්වල පවතින සීමිත බව සැලකිල්ලට ගනිමින් සමාජ යටිතල පහසුකම් සැපයීම හා ආකර්ෂණය ජීවනෝපාය මාර්ග සැලසීම සමස්ත ශ්‍රම බළකාය ආවරණය වන පරිදි වෙළෙඳ පොළ මූලික කරගත් විශ්‍රාම වැටුප් ක්‍රම හා විශ්‍රාම පාරිතෝෂික ක්‍රමයක් හඳුන්වා දෙමින් රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුපෙහි තිරසාර බව සහතික කිරීම, මූල්‍ය අතරමැදිකරණයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, විවිධාකාර මූල්‍ය උපකරණ හා සේවා හඳුන්වා දීම, විධිමත් මූල්‍ය කටයුතු සඳහා වන ප්‍රවේශයන් වර්ධනය කිරීම මෙන්ම මැදි හා දිගුකාලීනව ශක්තිමත් ආර්ථික වර්ධන මාවතක් පවත්වා ගැනීම සඳහා දේශීය හා විදේශීය අංශ සඳහා ආරක්ෂණ ප්‍රතිපත්ති ගොඩනැගීම තුළින් මූල්‍ය අංශයේ කටයුතු පුළුල්වීම සඳහා ඉඩ සලසා දීම යනාදිය ප්‍රමුඛ වන බවද ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දී තිබේ.

STOCK MARKET

සමස්ත මිල දර්ශකය

DATE	20	22	25	26	27
සමස්ත මිල දර්ශකය	6,423.13	6,422.65	6,379.53	6,405.29	6,434.24
S&P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය	3,395.71	3,395.84	3,369.52	3,397.66	3,404.98

TOP 10 GAINERS & LOSERS

	Gainers					Losers			
01	LANKA CEMENT	6.50	7.20	0.70	01	CFL	0.70	0.60	(0.10)
02	CITRUS KALPITIYA	3.00	3.30	0.30	02	HAPUGASTENNE	22.40	20.10	(2.30)
03	KELANI VALLEY	63.00	69.00	6.00	03	LIGHTHOUSE HOTEL	58.00	52.50	(5.50)
04	DUNAMIS CAPITAL	20.10	22.00	1.90	04	KAHAWATTE	38.40	35.20	(3.20)
05	CITRUS WASKADUWA	4.70	5.10	0.40	05	LANKA CERAMIC	132.50	122.50	(10.00)
06	PEOPLE'S MERCH	18.00	19.50	1.50	06	ABANS FINANCIAL	40.30	37.60	(2.70)
07	CEYLON LEATHER	71.00	76.80	5.80	07	SINGER IND.	170.00	160.00	(10.00)
08	UDAPUSSELLAWA	24.30	26.20	1.90	08	MILLENNIUM HOUSE	7.50	7.10	(0.40)
09	NATION LANKA	1.30	1.40	0.10	09	LEE HEDGES	390.00	370.00	(20.00)
10	CEYLON GUARDIAN	140.30	150.00	9.70	10	ASCOT HOLDINGS	30.30	28.80	(1.50)

CURRENCY EXCHANGE RATES

DOLLAR	20	22	25	26	27
Buying	143.18	143.18	143.43	143.46	143.57
Selling	146.99	147.00	147.24	147.27	147.30

POUND	20	22	25	26	27
Buying	205.42	204.98	206.58	207.58	208.82
Selling	212.72	212.29	213.94	214.96	216.22